අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

තනතුරු පුරප්පාඩු

2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත බලාත්මක කිරීම සඳහා පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ පවතින පහත සඳහන් කාර්ය මණ්ඩල පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුරු - 01

වැටුප් පරිමාණය
HM 1-3- 2025 - 152,500-15X4,100-214,000.00

මූලික වැටුප් පියවර :
2026.01.01 දිනට ගෙවන මුදල් රු. 133,028.00
2027.01.01 දිනට ගෙවන මුදල් රු. 152,500.00
(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2025/01හි උපලේඛණයට අනුව 2025/01/01-2025/12/31)

සුදුසුකම් හා පළපුරුද්ද:

බාහිර අයදුම්කරුවන්

කළමනාකරණ/ව්‍යාපාර පරිපාලනය/වාණිජ/මූල්‍ය කළමනාකරණය/ගිණුම්කරණය හෝ වෙනත් අදාළ විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම

සමඟ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වාණිජ/මූල්‍ය කළමනාකරණය හෝ වෙනත් අදාළ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (ශාස්ත්‍රපති) ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, හෝ අදාළ රාජ්‍ය නොවන හෝ වාණිජ්‍ය ආයතනයක “කළමනාකරණ මට්ටමේ” තනතුරක අවම වයෙන් වසර පහළොවක (15)ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

කළමනාකරණය/ව්‍යාපාර පරිපාලනය/රාජ්‍ය පරිපාලනය/මානව සම්පත් කළමනාකරණය හෝ වෙනත් අදාළ විෂය ක්ෂේත්‍රයකින් පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, හෝ අදාළ රාජ්‍ය නොවන හෝ වාණිජ්‍ය ආයතනයක “කළමනාකරණ මණ්ටමේ ” තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

මෙම තනතුරට අදාළ ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

කළමනාකරණ සේවා (MM) ගණයෙහි 1 වන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස:

අවු:35ට නොඅඩු හා අවු:55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

2. විමර්ශන නිලධාරි MA 4 - තනතුරු 01

වැටුප් පරිමාණය :
MA 4: රු.64,320-10x1,360-15x1,670-5x2,040-113,170

මූලික වැටුප් පියවර :
2025.01.01 දිනට ගෙවන මුදල් රු. 52,875.00 ,**2026.01.01** දිනට ගෙවන මුදල් රු. 58,598.00
2027.01.01 දිනට ගෙවන මුදල් රු. 64,320.00
(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2025/01හි උපලේඛණයට අනුව 2025/01/01-2025/12/31)

සුදුසුකම් හා පළපුරුද්ද :

බාහිර අයදුම්කරුවන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය පිළිබඳ ප්‍රථම උපාධියක් හෝ නීතිය හෝ අපරාධ විද්‍යා (Criminology) විෂයක් ලෙස ඇතුලත්ව උපාධියක් ලබා තිබීම.

හෝ

ශ්‍රී ලංකා පොලිස් සේවයේ පොලිස් පරීක්ෂක ධූරයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධාරියෙකු වීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

මෙම තනතුරට අදාළ ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA1-1) සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර අට (08)ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස:

අවු:22ට නොඅඩු හා අවු:45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

ප්‍රතිලාභ :

1. ඉහත 1 සහ 2 තනතුරු සඳහා ජීවන වියදම් දීමනාව.
2. ඉහත 1 තනතුර භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව තනතුරට හිමි අනෙකුත් දීමනා (වෘත්තීය දීමනා, ප්‍රවාහන දීමනා, ඉන්ධන දීමනා, දුරකථන දීමනා)
3. අධිකාරිය විසින් සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% හා සේවක නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 3%ක දායක වනු ඇත.

ඉල්ලුම්පත් කැඳවන අවසාන දිනට (2026.11.27) මෙම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

<u>පොදු කොන්දේසි</u>

01. සෑම ඉල්ලුම්කරුවෙක්ම

    I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
    II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
    III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

02. ඉහත සුදුසුකම් හා තනතුරට අදාළ පළපුරුද්ද සනාථ කෙරෙන සහතිකපත්වල ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.
03. සේවක අර්ථසාධක අරමුදල සඳහා 8%ක දායකත්වයක් ඔබ විසින් දැරිය යුතුය.
04. අයදුම්කරුවන් විසින් අනිසි බලපෑම් කිරීම හෝ විමසීම් සිදු කිරීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත.
05. අයදුම්පත් කැඳවීම අවසන් කරනු ලබන දිනට නොලැබෙන සියලු අයදුම්පත් සහ සහතික පත්වල පිටපත් ඉදිරිපත් කර නොමැති සියලු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද හා සියලු තොරතුරු ඇතුළත් ඔබ විසින් සකස් කරන ලද ජීව දත්ත සටහනක් සියලු සහතික පිටපත් සමඟ ලියාපදිංචි තැපෑලෙන්, **සභාපති, අපරාධයක විඳින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය,428/11 ඒ, පළමු මහල, ඩෙන්සිල් කොඩ්බෑකඩුව මාවත, බත්තරමුල්ල** යන ලිපිනයට 2026.11.27 දිනට ප්‍රථම ලැබෙන පරිදි යොමු කළ යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

සභාපති
අපරාධයක විඳින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය,
428/11 ඒ, පළමු මහල, ඩෙන්සිල් කොඩ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
දු. අංක. 0112879539
දිනය 2026.11.09